කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී සිව්වන වසර අවසාන පරීක්ෂණය

පළමු සෙමෙස්තරය - 2022/2023

**INR 4187- දෙවන ලෝක යුද්ධයෙන් පසු රුසියාව**

කාලය : පැය <u>දෙකයි (02)</u>

ඕනෑම ප්‍රශ්න <u>තුනකට (03)</u> පිළිතුරු සපයන්න.

---

1. පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කරමින්, සෝවියට් දේශය තුළ නිකිතා කෘෂ්චෙව්ගේ (Nikita Khrushchev) භූමිකාව විශ්ලේෂණය කරන්න.

   i. වැදගත් දින වකවානු සහ සිදුවීම්
   ii. ප්‍රධාන වර්ධනයන් සහ පසුබෑම්
   iii. පාලනයේ සුවිශේෂී ලක්ෂණ

2. පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කරමින්, ලියනොයිඩ් බ්‍රෙෂ්නෙව්ගේ (Leonid Brezhnev ) පාලන සමය පිළිබඳ විශ්ලේෂණාත්මක රචනයක් ලියන්න.

   i. වැදගත් දින වකවානු සහ සිදුවීම්
   ii. තුෂ්ණී යුද්ධයට දායකත්වය
   iii. ප්‍රධාන දේශපාලන වර්ධනයන්

3. මිකායිල් ගොර්බචෙව්ගේ (Mikhail Gorbachev) ප්‍රධාන ප්‍රතිපත්ති, සිදුවීම් සහ ඔබ සිතන ආකාරයට සෝවියට් දේශය බිඳ වැටීම කෙරෙහි ඔහුගේ භූමිකාව දායකවූ ආකාරය ඉස්මතු කරමින්, මිකායිල් ගොර්බචෙව්ගේ සෝවියට් සංගමයේ ධුර කාලය පිළිබඳ තක්සේරු කරන්න.

4. <u>එක්කෝ</u>

   i. 'ඉතා තීරණාත්මක අවධියක සිටි නායකයෙකු ලෙස බොරිස් යෙල්ට්සින් (Boris Yeltsin) දැක්විය හැකිය'. බටහිර සමග පැවති සබඳතා කෙරෙහි අවධානය යොමු කරමින් ඔහුගේ විදේශ ප්‍රතිපත්තියේ සාර්ථකත්වය හා අසාර්ථකත්වය රුසියානු රාජ්‍යයට බලපෑම් කළ ආකාරය විග්‍රහ කරන්න.

   <u>නැතහොත්</u>

   ii. 'ව්ලැඩිමීර් පුටින් (Vladimir Putin) දශක දෙකකට වැඩි කාලයක් නායකත්වයේ සිට ඇත'. ඔහුගේ නායකත්වයේ සාර්ථකත්වයන් සහ අසාර්ථකත්වයන් හඳුනාගෙන ඒවා රුසියාවට ඇති කර ඇති බලපෑම විශ්ලේෂණය කරන්න.

5. පහත සඳහන් ඕනෑම නායකයෙකු තෝරාගෙන, සෝවියට් දේශයේ සංවර්ධනයට සහ ජාත්‍යන්තර සබඳතා සඳහා ඔවුන්ගේ ප්‍රධාන ප්‍රතිපත්ති බලපෑ ආකාරය විශ්ලේෂණය කරන්න.

   i. ව්ලැඩිමීර් ලෙනින් (Vladimir Lenin)
   ii. ජෝසප් ස්ටාලින් (Joseph Stalin)
   iii. යූරි ඇන්ඩ්‍රොපොව් (Yuri Andropov)
   iv. කොන්ස්ටන්ටින් චර්නෙන්කෝ (Konstantin Chernenko)



*****************